**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**

பொலிஸ் ஊடகப் பிரிவு

**POLICE MEDIA DIVISION**

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.03.21 පැය 1730 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/549/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## 161 වන පොලිස් විරු අනුස්මරණ දිනය වෙනුවෙන් මහනුවර ශ්‍රී දළදා මාළිගාවේදී පවත්වන ලද මුල්තැන් පූජාව සම්බන්ධව.

161 වන පොලිස් විරු අනුස්මරණය **2025.03.21 වන අද දින උදෑසන බම්බලපිටිය පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ පිහිටි විරු සමරු ස්මාරකය අභියසදී වැඩබලන පොලිස්පතිතුමාගේ ප්‍රධානත්වයෙන්** සිදු කරන ලද අතර මීට සමගාමීව දිවයින පුරා සියළුම පොලිස් කොට්ඨාස වල පොලිස් විරු දිනය අනුස්මරණය කිරීම සිදු කෙරිණි.

පොලිස් විරු අනුස්මරණ දිනය නිමිති කර ගෙන පොලිස් බෞද්ධ හා ආගමික කටයුතු පිළිබඳ සංගමය මඟින් වාෂරිකව සංවිධානය කරනු ලබන මුල්තැන් පූජාව, දානමය පිංකම සහ කොට්ඨාස ධජ ආශිවර්ාද ගැන්වීම 2025 මාතර්ු මස 20 සහ 21 වන දිනවල මහනුවර ශ්‍රී දළදා මාළිගය පරිශ්‍රයේදී පැවැත්විණි.

2025.03.20 වන දින දළදා වහන්සේ වෙත ගිලන්පස පූජාවෙන් පසු පොලිස් කොට්ඨාසයන් වල ධජ ආශිවර්ාද ගැන්වීම සිදු කරන ලදී. 2025.03.21 වන අද දින උදෑසන ශ්‍රී දළදා වහන්සේ වෙනුවෙන් මුල්තැන් පූජාව සිදු කිරීමෙන් පසු මහ සඟරුවන උදෙසා දහවල් දානය පිළිගන්වන ලදී.

මෙම අවස්ථාව සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පරිපාලන ලලිත් පතිනායක මහතා, මහනුවර කොට්ඨාසයේ උසස් පොලිස් නිලධාරීන්, පොලිස් බෞද්ධ හා ආගමික කටයුතු සංගමයේ නිලධාරීන් ඇතුළු පොලිස් නිලධාරීන් රැසක් සහභාගී විය.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක්




Minister Security Division
පානදුර









**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**